## සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බුද්ධ ධර්මය - 2 ශ්‍රේණිය     ඔක්තෝබර් 4 සතිය

සැකසුම් බලංගොඩ අධ්‍යාපන කලාපය / H.B.C.ප්‍රියදර්ශනී ර/හුණුවල ධර්මරාජ ම.වි

❖ අද මම පුතාලට ලස්සන කතාවක් කියාදෙන්නයි යන්නෙ . ඒක අහල හොඳට මතක තියා ගන්න ඕනි.

අපේ බුදු හාමුදුරුවන්ට හිටිය සැරියුත් මුගලන් කියල අගසවු හාමුදුරුවරු දෙදෙනෙක්. දවසක් පුතේ අපේ බුදු හාමුදුරුවෝ ළඟ මහන වුනා ඡන්න කියල කෙනෙක් .ඉතිං පුතේ මේ ඡන්න හාමුදුරුවෝ බලාගන්න බාර දුන්නෙ අර සැරියුත් මුගලන් අගසවු දෙදෙනාටයි. මේ ඡන්න හාමුදුරුවෝ හරිම අකීකරුයි.දෙන අවවාද පිළිගන්නෙත් නැහැ. ඉතිං බැරිම තැන අගසවු දෙදෙනා මේ ගැන බුදු හාමුදුරුවන්ට කිවුවා. කීප වතාවක්ම අපේ බුදු හාමුදුරුවොත් අවවාද කළා.ඒත් ඡන්න හාමුදුරුවෝ හොඳ මගට ගන්න බැරි වුනා. අන්තිමට පුතේ මොකද දන්නවද උනේ,බුදු හාමුදුරුවෝ ඡන්න හාමුදුරුවන්ට “බ්‍රහ්ම දණ්ඩනය” පැනෙවුවා.

බ්‍රහ්ම දණ්ඩනය කියන්නෙ පුතේ අකීකරු කෙනෙක් කීකරු වෙනකම්ම කවුරුවත්ම එයා එක්ක කතා නොකර සිටීමයි.ඉතිං මේ ඡන්න හාමුදුරුවන්ටත් දුන්නෙ ඒ දඬුවමමයි.

1.. දැන් පුතාලට මතකයිනෙ කතාව නේද? එහෙනම් පහළින් තිබෙන වැකි හරි නම් (√) ලකුණත් වැරදි නම් ( × ) ලකුණත් යොදන්න.

- සැරියුත් මුගලන් අගසවු දෙදෙනයි. ☐
- ඡන්න හාමුදුරුවෝ හරිම කීකරුයි. ☐
- බුදු හාමුදුරුවෝ බ්‍රහ්ම දණ්ඩනය පැනෙවි ☐

2. යහපත් දරුවෙකු වන ඔබ ළඟ තිබෙන හොඳ ගති 3 ක් ලියන්න.

3. බුද්ධාගම පෙළ පොතේ 28 පාඩම "යහපත් මිතුරු ඇසුර" හොඳින් කියවන්න. ඔබේ හිතට දැනුන දේ චිත්‍රයට නගන්න.

4. 28 සහ 29 පාඩම් ඇසුරෙන් සාර ධර්ම ගසක් නිර්මාණය කරන්න.